සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2021 (2022)

# 32 - ව්‍යාපාර අධ්‍යයනය

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

Visit EDUHUB

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2021 (2022)

## 32 - ව්‍යාපාර අධ්‍යයනය

## ප්‍රශ්නපත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදීයාම

**අභිමතාර්ථ :** ව්‍යාපාර අධ්‍යයනය විෂය නිර්දේශයෙන් අපේක්ෂිත අභිමතාර්ථ ඉටු වී ඇති අකාරය තක්සේරු කිරීමට හැකිවන පරිදි මෙන්ම විෂය දැනුම, අවබෝධය, භාවිතය, විශ්ලේෂණය හා සංස්ලේෂණය හැකියාවන් වඩාත් හොඳින් ඇගයීමට ලක් කිරීමට හැකිවන අයුරින් ප්‍රශ්න හා ගැටළු මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු කර ඇත.

**ලකුණු පිරිනමන ආකාරය**

**ව්‍යාපාර අධ්‍යයනය I.**

| | | | |
|---|---|---|---|
| බහුවරණ 30 යි. | **ලකුණු 02 බැගින්** | - | 60 |
| හිස්තැන් පිරවීම 10 | **ලකුණු 02 බැගින්** | - | 20 |
| නිශ්චිත කෙටි පිළිතුරු 10 | **ලකුණු 02 බැගින්** | - | 20 |
| | | | 100 |

**ව්‍යාපාර අධ්‍යයනය II.**

**අ. කොටස - ප්‍රශ්න 04 යි**

**ආ. කොටස - ප්‍රශ්න 04 යි**

එක් කොටසකින් ප්‍රශ්න 02 ක් වත් තෝරා ගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතු ය.

1 සිට 8 දක්වා ප්‍රශ්න 08 යි. සෑම ප්‍රශ්නයක්ම කොටස් 05 කින් යුක්තවේ.

කොටසකට ලකුණු 04 බැගින් ප්‍රශ්නයකට ලකුණු 20 යි.

මුළු ලකුණු ප්‍රශ්න 05 ට ලකුණු 20 බැගින් - 100

**අවසාන ලකුණ - 100**

Visit EDUHUB

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

| | | | |
|---|---|---|---|
| (i) | ..........................................................<br>..........................................................<br>.......................................................... | √ | △ $\frac{4}{5}$ |
| (ii) | ..........................................................<br>..........................................................<br>.......................................................... | √ | △ $\frac{3}{5}$ |
| (iii) | ..........................................................<br>..........................................................<br>.......................................................... | √ | △ $\frac{3}{5}$ |

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\boxed{\frac{10}{15}}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න.

ණු කර

තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

Visit EDUHUB

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න.

***

Visit EDUHUB

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021 (2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021 (2022)

ව්‍යාපාර අධ්‍යයනය I
வணிகக் கல்வி I
Business Studies I

32 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

උපදෙස්:
- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- ※ **විභාග අංකය**, ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.
- ※ ප්‍රශ්න අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ※ ප්‍රශ්න අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- ※ සෑම ප්‍රශ්නයකට ම ලකුණු **දෙක** බැගින් හිමි වේ.

විභාග අංකය : ..........................................

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංක | ලකුණු |
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අති. ප්‍රධාන පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |

**1.** සෑම භාණ්ඩයක් හා සේවාවක් මගින් ම පාරිභෝගික
(1) අවශ්‍යතා ඉටු කරයි.
(2) වුවමනා ඉටු කරයි.
(3) අවශ්‍යතා හා වුවමනා ඉටු කරයි.
(4) අවශ්‍යතා ඉටු කිරීමට හිඟ සම්පත් භාවිත කරයි.
(5) වුවමනා ඉටු කිරීමට හිඟ සම්පත් භාවිත කරයි. (......)

**2.** ප්‍රාථමික නිෂ්පාදන යනු,
(1) අතුරු නිෂ්පාදන වේ. (2) සකස් නොකළ අමුද්‍රව්‍ය වේ.
(3) උපකාරක සේවා වේ. (4) අර්ධ නිමි භාණ්ඩ වේ.
(5) නිමි භාණ්ඩ වේ. (......)

**3.** නිෂ්පාදනයක් සඳහා 'එකතු කළ අගය' යනු,
(1) අමුද්‍රව්‍ය පිරිවැයයි.
(2) නිෂ්පාදන පිරිවැයයි.
(3) නිෂ්පාදන පිරිවැය සහ ලාභයේ එකතුවයි.
(4) නිෂ්පාදන පිරිවැය සහ විකුණුම් මිල අතර වෙනසයි.
(5) සෑම නිෂ්පාදන අදියරක දී ම වැඩිවන වටිනාකමයි. (......)

**4.** සංවිධානයක යෙදවුම්-නිමැවුම් ක්‍රියාවලිය පිළිබිඹු කරනු ලබන්නේ,
(1) මූල්‍ය ක්‍රියාවලිය මගිනි.
(2) නිෂ්පාදන ක්‍රියාවලිය මගිනි.
(3) මිල දී ගැනීම ක්‍රියාවලිය මගිනි.
(4) අලෙවිකරණ ක්‍රියාවලිය මගිනි.
(5) තොරතුරු කළමනාකරණ ක්‍රියාවලිය මගිනි. (......)

**5.** ව්‍යාපාරයක ආසන්න පරිසර බලවේගයක් වන්නේ,
(1) පාරිභෝගිකයින් ය. (2) කළමනාකරුවන් ය. (3) සේවකයින් ය.
(4) සංවිධාන ව්‍යුහයන් ය. (5) අයිතිකරුවන් ය. (......)

Visit EDUHUB

**6.** ප්‍රජා සත්කාර සේවාවේ නිරත වීම මගින් ව්‍යාපාර සමාජීය වගකීම ඉටු කරනු ලබන්නේ,

(1) රජය වෙනුවෙනි. (2) සමාජය වෙනුවෙනි. (3) රට වෙනුවෙනි.
(4) ගණුදෙනුකරුවන් වෙනුවෙනි. (5) අයිතිකරුවන් වෙනුවෙනි. (……)

**7.** සුපිරි වෙළෙඳසැලකින් භාණ්ඩ මිලට ගැනීමේ දී පාරිභෝගිකයාට,

(1) සේවක අවධානය ඍජුව ලබාගත හැකි ය.
(2) ඕනෑම සේවාවක් ලබාගත හැකි ය.
(3) ණයට භාණ්ඩ මිල දී ගත හැකි ය.
(4) නිෂ්පාදන පරාසයකින් තෝරීම කළ හැකි ය.
(5) භාණ්ඩ මිල ගණන් කේවල් කිරීමට හැකි ය. (……)

**8.** අපද්‍රව්‍ය කළමනාකරණයේ 4R සංකල්ප සහ ඒවාට අදාළ උදාහරණ පහත වගුවේ දක්වා ඇත.

| සංකල්ප | උදාහරණ |
|---|---|
| (i) ප්‍රතිචක්‍රීයකරණය | A - මුද්‍රණය කිරීම වෙනුවට ලිපි පරිගණක තිරයේ කියවීම |
| (ii) නැවත ස්ථාපිත කිරීම | B - ඉවතලන කඩදාසි, කෙටි සටහන් ලිවීම සඳහා යොදා ගැනීම |
| (iii) භාවිතය අඩු කිරීම | C - භාවිතයෙන් ඉවත් කළ ජංගම දූරකථන කොටස් යොදාගෙන ඔලිම්පික් පදක්කම් නිපදවීම |
| (iv) නැවත භාවිත කිරීම | D - පලතුරු හා එළවළු අපද්‍රව්‍යවලින් කාබනික පොහොර නිපදවීම |

ඉහත දී ඇති සංකල්ප අනුපිළිවෙළ අනුව, උදාහරණ නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) A, D, B, C (2) B, C, A, D (3) B, D, C, A
(4) D, A, C, B (5) D, C, A, B (……)

**9.** ව්‍යාපාරික අරමුණු සහ ඒවා ඉටුකර ගැනීමට යොදා ගන්නා ලද ක්‍රියාකාරකම් පහත වගුවේ දක්වා ඇත.

| අරමුණු | ක්‍රියාකාරකම් |
|---|---|
| (i) විකුණුම් ආදායම් වර්ධනය | A - දෙපාර්තමේන්තු අතර අන්තර් සම්බන්ධතාව වැඩි කිරීම |
| (ii) මූල්‍ය ප්‍රවාහ වර්ධනය | B - භාණ්ඩවල ගුණත්වය වැඩි කිරීම |
| (iii) පාරිභෝගික තෘප්තිය වර්ධනය | C - රක්ෂණ පහසුකම් ලබාදීම |
| (iv) සේවක කුසලතා වර්ධනය | D - වෙළඳ වට්ටම් ලබාදීම |
| (v) සේවක සුභසාධනය වර්ධනය | E - ණයගැති පිරිවැටුම් කාලය අඩු කිරීම |

ඉහත දී ඇති අරමුණු අනුපිළිවෙළ අනුව, ඊට ගැළපෙන ක්‍රියාකාරකම් නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) A, D, E, C, B (2) B, E, C, A, D (3) B, C, D, E, A
(4) D, B, A, E, C (5) D, E, B, A, C (……)

**10.** ව්‍යාපාරයක ස්ථාවර වත්කමක් විකිණීමේ දී එම වත්කමේ පිරිවැයට වඩා වැඩියෙන් ලැබෙන ප්‍රතිශ්ඨාව බදු ගණනය කිරීමේ දී සැලකෙන්නේ,

(1) ලාභය ලෙසිනි. (2) ප්‍රාග්ධන ලාභය ලෙසිනි.
(3) ආදායම ලෙසිනි. (4) ප්‍රාග්ධන සංචිතය ලෙසිනි.
(5) අයභාර ලාභය ලෙසිනි. (……)

**11.** හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තියෙහි සඳහන් වන්නේ,

(1) ප්‍රාග්ධනය වෙනුවෙන් පොලියක් හවුල්කරුවන්ට ගෙවිය යුතු ය.
(2) හවුල්කරුවන්ගේ අමතර ප්‍රාග්ධන ආයෝජනයට 5%ක වාර්ෂික පොලියක් හිමි ය.
(3) හවුල්කරුවන්ගේ සේවය වෙනුවෙන් වේතනයක් ගෙවිය යුතු ය.
(4) එක් හවුල්කරුවකුගේ කැමැත්ත මත නව හවුල්කරුවෙකු බඳවාගත හැකි ය.
(5) ලාභ හෝ අලාභ හවුල්කරුවන් යෙදූ ප්‍රාග්ධන අනුපාතය අනුව බෙදාගත යුතු ය. (……)

Visit EDUHUB

**12.** සාමාන්‍ය කොටස් හිමියන් සමඟ සැසඳීමේ දී වරණීය කොටස් හිමියන්ට,

| | ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය | විසුරුවා හැරීමේ දී ආයෝජන මුදල් ලබාගැනීමේ ප්‍රමුඛතාවය | ලාභාංශ සඳහා ප්‍රමුඛතාවය |
|---|---|---|---|
| (1) | හිමි වේ. | හිමි වේ. | හිමි වේ. |
| (2) | හිමි වේ. | හිමි වේ. | හිමි නොවේ. |
| (3) | හිමි නොවේ. | හිමි නොවේ. | හිමි නොවේ. |
| (4) | හිමි නොවේ. | හිමි වේ. | හිමි වේ. |
| (5) | හිමි නොවේ. | හිමි නොවේ. | හිමි වේ. |

(......)

**13.** ව්‍යවසායකයින් සෑම විට ම,
(1) මූල්‍ය ප්‍රතිලාභ පමණක් අපේක්ෂා කරයි.
(2) ඉහළ සමාජ මට්ටමක් අපේක්ෂා කරයි.
(3) නව ව්‍යාපාර සඳහා සම්පත් ආයෝජන කරයි.
(4) පවත්නා ව්‍යාපාරයෙහි ඒ අයුරෙන් ම නියෙලෙයි.
(5) කළමනාකරුවන් හට සියලු ම තීරණ ගැනීමට ඉඩ සලසයි. (......)

**14.** මාර්ගගත ගනුදෙනු සිදු වන්නේ,
(1) ආයතනික මැදිහත්වීමකින් තොරව ය.
(2) මූල්‍යමය මැදිහත්වීමකින් තොරව ය.
(3) විද්‍යුත් උපකරණයක මැදිහත්වීමකින් තොරව ය.
(4) සැපයුම්කරුවකුගේ මැදිහත්වීමකින් තොරව ය.
(5) අතරමැදියකුගේ මැදිහත්වීමකින් තොරව ය. (......)

**15.** ජීවිත රක්ෂණය,
(1) ඉතිරි කිරීමකට සමාන වේ.
(2) හානිපූර්ණ මූලධර්මය මත පදනම් වේ.
(3) වෙනත් අයකුට පැවරිය හැකි වේ.
(4) නිශ්චිත අවදානමක් හා නොබැඳේ.
(5) වාර්ෂිකව අලුත් කළ යුතු වේ. (......)

**16.** සේවක අභිප්‍රේරණ ක්‍රම කිහිපයක් පහත දැක්වේ.

A – උසස්වීම්
B – කොටස් හිමිකාරිත්වය
C – සම්මාන
D – ණය පහසුකම්
E – සහන මිලට නිෂ්පාදිත සැපයීම
F – පුහුණුව
G – ප්‍රසාද දීමනා
H – කාර්යසාධන ඇගයීම
I – දීමනා

ඉහත දෑ අතුරෙන් මූල්‍ය අභිප්‍රේරණ ක්‍රම පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) A, C, E, F, G (2) B, D, E, G, I (3) B, E, G, H, I
(4) D, E, F, G, H (5) D, E, G, H, I (......)

**17.** පණිවුඩ හා සන්නිවේදන ක්‍රම කිහිපයක් පහත වගුවේ දක්වා ඇත.

| පණිවුඩ | සන්නිවේදන ක්‍රම |
|---|---|
| (i) විභාගය සමත් වූ සිසුන්ගේ නාම ලේඛනය පාසලේ ප්‍රසිද්ධ කිරීම | A - ලිපිය |
| (ii) විදේශ සැපයුම්කරුට හදිසි ඇණවුමක් වාචිකව සන්නිවේදනය කිරීම | B - විද්‍යුත් තැපෑල |
| (iii) සේවක පත්වීමක් තැපැල් මගින් දැනුම් දීම | C - දැන්වීම් පුවරුව |
| (iv) ආයතනයකට පැමිණිය යුතු මාර්ගය පිළිබඳව සවිස්තරාත්මක සිතියමක් කඩිනමින් යැවීම | D - සම්මන්ත්‍රණය |
| (v) රටේ ආර්ථික තත්වය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම | E - දුරකථන ඇමතුම |

ඉහත දී ඇති පණිවුඩ අනුපිළිවෙළ අනුව, ඊට ගැළපෙන සන්නිවේදන ක්‍රම නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?
(1) B, C, A, E, D (2) B, C, E, D, A (3) C, B, D, A, E
(4) C, E, A, B,D (5) E, B, C, A, D (......)

Visit EDUHUB

**18.** ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධතියක් සතු ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A – භාණ්ඩ ඇණවුම් කිරීම
B – තොග ලැබීම
C – ගනුදෙනුකරුවන් සමඟ සම්බන්ධ වීම
D – විකුණුම් ප්‍රවර්ධනය කිරීම
E – නිකුත් කිරීම සඳහා භාණ්ඩ යළි ලබා ගැනීම
F – ගුණත්වය තහවුරු කර ගැනීම
G – භාණ්ඩ පරීක්ෂා කිරීම
H – නිවැරදි බව තහවුරු කර ගැනීම
I – ඉල්ලුම සහ සැපයුම අතර සමතුලිතතාවය පවත්වා ගැනීම
J – පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල නියුක්ත වීම

ඉහත දැ අතුරෙන් ගබඩාකරණයට අයත් ලක්ෂණ පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, B, C, D, I (2) B, C, H, I, J (3) B, E, F, G, H
(4) D, G, E, F, J (5) F, G, H, I, J (……)

**19.** පහත වගුවේ නිෂ්පාදන සහ බෙදාහැරීමේ මාර්ග කිහිපයක් දක්වා ඇත.

| නිෂ්පාදන | බෙදාහැරීමේ මාර්ග |
|---|---|
| (i) නුවරඑළියේ එළවළු | A- නිෂ්පාදකයා → සිල්ලර වෙළෙන්දා → පාරිභෝගිකයා |
| (ii) ආනයනික කිරිපිටි | B- නිෂ්පාදකයා → තොග වෙළෙන්දා → සිල්ලර වෙළෙන්දා → පාරිභෝගිකයා |
| (iii) මංගල කේක් | C- නිෂ්පාදකයා → පාරිභෝගිකයා |
| (iv) කුඩා පරිමාණ ගෙවතු වගා පලතුරු | D- නිෂ්පාදකයා → නියෝජිතයා → තොග වෙළෙන්දා → සිල්ලර වෙළෙන්දා → පාරිභෝගිකයා |

ඉහත දී ඇති නිෂ්පාදන අනුපිළිවෙළ අනුව ඊට අදාළ බෙදාහැරීමේ මාර්ග නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) A, C, B, D (2) A, D, C, B (3) B, C, A, D
(4) B, D, C, A (5) C, B, D, A (……)

**20.** මානව කුසලතා සහිත කළමනාකරුවන්,

(1) සේවකයින්ගේ අවශ්‍යතාවලට සංවේදී වෙයි.
(2) සේවකයින්ට සෑම විට ම නායකත්වය ලබාදෙයි.
(3) සේවක කුසලතා පමණක් අගය කරනු ලබයි.
(4) ඉහළ කළමනාකාරිත්වයට පමණක් වැදගත් වෙයි.
(5) මධ්‍ය කළමනාකරණයට පමණක් වැදගත් වෙයි. (……)

**21.** ව්‍යාපාරික දැක්ම,

(1) නිශ්චිත අරමුණු ළඟා කර ගැනීමට සේවකයින්ට බලපෑම් කිරීමේ හැකියාව පෙන්වයි.
(2) ව්‍යාපාරය ගමන් කළ යුතු දිශාව සහ එහි සමස්ත කාර්ය සම්පිණ්ඩනය කර පෙන්වයි.
(3) කළමනාකරුවන්ගේ අරමුණු සේවකයින් සමඟ බෙදාගැනීමට සහ ඔවුන්ව අභිප්‍රේරණයට මගපෙන්වයි.
(4) නම්‍යශීලී, අනුවර්තනය විය හැකි සහ කාර්යක්ෂම ව්‍යාපාරයක් බව පෙන්වයි.
(5) ගැටලු විසඳීම සඳහා සුදුසු උපායමාර්ග හඳුනාගැනීමට ඇති හැකියාව පෙන්වයි. (……)

**22.** සේවා සැපයීමේ ආයතනයක්, නිෂ්පාදන ආයතනයකින් වෙනස් වන්නේ,

(1) ශ්‍රම පිරිවැය මත ය. (2) ද්‍රව්‍ය පිරිවැය මත ය.
(3) ප්‍රාග්ධන පිරිවැය මත ය. (4) ඍජු පාරිභෝගික සම්බන්ධතා මත ය.
(5) නිෂ්පාදනවල ගුණත්වය මත ය. (……)

**23.** ප්‍රකාශය **A** : 'තත්ත්ව පාලනය' යනු නිෂ්පාදනයේ කිසිදු දෝෂයක් නොමැති බව තහවුරු කර ගැනීම සඳහා නිෂ්පාදන පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියයි.

ප්‍රකාශය **B** : තත්ත්ව පාලනය තුළින් නිෂ්පාදනයේ කිසිදු දෝෂයක් සිදු නොවන හෙයින් සෑම නිෂ්පාදන ඒකකයක් ම උසස් තත්ත්වයේ පවතියි.

ඉහත ප්‍රකාශ දෙක අතුරෙන්,

(1) **A** සත්‍ය වන අතර **B** අසත්‍ය වේ.
(2) **A** අසත්‍ය වන අතර **B** සත්‍ය වේ.
(3) **A** සහ **B** දෙකම අසත්‍ය වේ.
(4) **A** සහ **B** සත්‍ය වන අතර **B** මගින් **A** පැහැදිලි කෙරේ.
(5) **A** සහ **B** සත්‍ය වන අතර **B** මගින් **A** පැහැදිලි නොකෙරේ. (……)

Visit EDUHUB

**24.** නිෂ්පාදන ආයතනයක වාර්ෂික ස්ථාවර පිරිවැය රුපියල් 92 000ක් වන අතර ඒකකයක අමුද්‍රව්‍ය හා ශ්‍රම පිරිවැය රුපියල් 5කි. ඒකකයක විකුණුම් මිල රුපියල් 9ක් නම්, ඒකක 25 000ක් නිපදවීමෙන් ලැබෙන ලාභය,

(1) රු. 8 000 කි. (2) රු. 33 000 කි. (3) රු. 125 000 කි.
(4) රු. 133 000 කි. (5) රු. 225 000 කි. (……)

**25.** ව්‍යාපාරයකට තම අලෙවිය වැඩි කිරීම සඳහා යොදාගත හැකි ක්‍රියාමාර්ග කිහිපයක් පහත වේ.

A – අනුග්‍රාහකත්වය ලබාදීම
B – කාර්යක්ෂමතා වර්ධනය
C – සාම්පල් බෙදාදීම
D – මිල අඩු කිරීම
E – ලෝයල්ටි පොයින්ට්ස් (Loyalty Points) ලබාදීම
F – ප්‍රචාරණය
G – නොමිලේ බෙදාහැරීම
H – කූපන් ලබාදීම

ඉහත දැ අතුරෙන්, විකුණුම් ප්‍රවර්ධනයට අදාළ ක්‍රියාමාර්ග පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, B, E, F, G (2) A, D, E, G, H (3) B, D, E, G, F
(4) C, D, E, G, H (5) C, E, F, G, H (……)

**26.** ව්‍යාපාරයක ද්‍රවශීලතා අනුපාතය 2019 වර්ෂයේ දී 3:1ක් සහ 2020 වර්ෂයේ දී 1:1ක් විය. එමගින් පෙන්නුම් කරන්නේ,

ප්‍රකාශය **A** : ද්‍රවශීලතාව වර්ධනය වී ඇති බව ය.
ප්‍රකාශය **B** : කෙටිකාලීන ණය පහසුවෙන් ගෙවිය හැකි බව ය.

ඉහත ප්‍රකාශ දෙක අතුරෙන්,

(1) **A** සත්‍ය වන අතර **B** අසත්‍ය වේ.
(2) **A** අසත්‍ය වන අතර **B** සත්‍ය වේ.
(3) **A** සහ **B** යන දෙකම අසත්‍ය වේ.
(4) **A** සහ **B** සත්‍ය වන අතර **B** මගින් **A** පැහැදිලි කෙරේ.
(5) **A** සහ **B** සත්‍ය වන අතර **B** මගින් **A** පැහැදිලි නොකෙරේ. (……)

**27.** පහත දැ අතුරෙන්, මානව සම්පත් කළමනාකරණයට අදාළ වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) තාක්ෂණික සේවක පුහුණුව අනුස්ථාපනය වේ.
(2) සේවක චලනය සේවක උසස්වීම වේ.
(3) සේවක වැඩ හා ප්‍රතිඵල මැනීම කාර්යඵල ඇගයීම වේ.
(4) සේවකයින් සඳහා වූ පුහුණුව රැකියාස්ථ පුහුණුව වේ.
(5) රැකියා කාර්යඵල ඉහළ නංවාලීමට සිදු කරන පුහුණුව සේවක සංවර්ධනය වේ. (……)

**28.** පහත දැ අතුරෙන්, විශේෂිත මූල්‍ය ආයතන කාණ්ඩයට අයත් **නොවන්නේ** කුමක් ද?

(1) ඒකක භාර (2) කොටස් තැරැව්කරුවන්
(3) ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම් (4) ප්‍රාථමික අලෙවිකරුවන්
(5) රක්ෂණ සමාගම් (……)

**29.** ව්‍යාපාරයක දත්ත හා තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

A - කාලසටහන්
B - ඒකකයක බර
C - ශිෂ්‍ය වාර්තා පොත්
D - භාණ්ඩ මිල
E - ගෙවීම් පත්‍රිකා
F - විකුණන ලද ඒකක ප්‍රමාණය
G - සේවක නම්
H - මුදල් ලදුපත්
I - බදු කේත

ඉහත දැ අතුරෙන්, දත්ත පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, C, F, G, H (2) B, D, F, G, I (3) B, D, E, G, I
(4) C, D, E, G, H (5) C, E, F, H, I (……)

**30.** බිස්කට් නිෂ්පාදන ආයතනයක ස්ථාවර පිරිවැය රු. 2 000ක් වේ. විචල්‍ය ශ්‍රම පිරිවැය ඒකකයකට රු. 5කි. ඒකක 1 000ක් නිපදවීමේ දී සාමාන්‍ය පිරිවැය වන්නේ,

(1) රු. 2 කි. (2) රු. 3.50 කි. (3) රු. 7 කි. (4) රු. 10 කි. (5) රු. 12 කි. (……)

Visit EDUHUB

● අංක **31** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී **සුදුසු වචනය/වචන** යොදා හිස්තැන් පුරවන්න.

**31.** (අ) භෞතික පැවැත්මේ පදනම මත පරිගණකය ..................... භාණ්ඩයකට උදාහරණයක් ලෙස ද පරිගණක මෘදුකාංග ..................... භාණ්ඩයකට උදාහරණයක් ද වේ.

(ආ) අන්තර්ජාලය මගින් සිදුවන සියලු ම ව්‍යාපාර ක්‍රියාකාරකම් විද්‍යුත් ......................... ලෙස හඳුන්වන අතර විද්‍යුත් ......................... එහි උප කොටසකි.

**32.** (අ) ඉලක්ක වෙළෙඳපොළ කොටස්වලට වෙන්කිරීමේ ක්‍රියාවලිය වෙළෙඳපොළ ................................. ලෙස ද පාරිභෝගිකයාගේ මනසෙහි සන්නමක් සඳහා ධනාත්මක ආකල්පයක් ඇති කිරීම වෙළෙඳපොළ ................................. ලෙස ද හැඳින්විය හැක.

(ආ) වෙළෙඳුන් විසින් නිර්මාණය කරනුයේ ................................. සන්නම වන අතර, ජාතික සන්නම නිර්මාණය කරනුයේ ................................. විසින් ය.

**33.** (අ) දන්තාලේප ටියුබය ......................... ඇසුරුමක් වන අතර, එය බහාලන පෙට්ටිය ......................... ඇසුරුමකි.

(ආ) සාමාන්‍ය කොටස් ......................... ප්‍රාග්ධනයට ද, වරණීය කොටස් ......................... ප්‍රාග්ධනයට ද ඇතුළත් වේ.

**34.** පහත දක්වා ඇති උදාහරණවලට අදාළව මුදලේ කාර්යයන් දක්වන්න.

| උදාහරණ | කාර්යය |
| --- | --- |
| 1. ඔරලෝසුවක් රු. 8 000කට මිල දී ගැනීම | 1. ............................................. |
| 2. රු. 25 000ක් ඉතිරි කිරීම | 2. ............................................. |
| 3. ණයට ගත් භාණ්ඩ සඳහා මුදල් මාස 6 කට පසු ගෙවීම | 3. ............................................. |
| 4. ජංගම දුරකථනයක් රු. 30 000කට මිල කිරීම | 4. ............................................. |

**35.** (අ) ගබඩා රහිත ............................. වෙළෙඳාම යනු ......................... වෙළෙඳසැලක් නොමැතිව සිදු කරන වෙළෙඳාමකි.

(ආ) B2G යනු ....................... විසින් ................................. ට අන්තර්ජාලය හරහා භාණ්ඩ, සේවා හා තොරතුරු අලෙවි කිරීමේ ව්‍යාපාර ආකෘතියකි.

**36.** (අ) ශ්‍රී ලංකා මහ බැංකුවෙහි නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව, නිත්‍ය ............................. පහසුකම් අනුපාතය හා නිත්‍ය ....................... පහසුකම් අනුපාතයෙන් සමන්විත වේ.

(ආ) ප්‍රධාන විධායක නිලධාරියා ....................... කළමනාකරණයට අයත්වන අතර අලෙවි කළමනාකරු ..................... කළමනාකරණයට අයත් වේ.

**37.** (අ) ඉන්දු ලංකා වෙළෙඳ ගිවිසුම ................................... පාර්ශ්වීය ගිවිසුමක් ලෙස ද උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම (NAFTA) ......................... පාර්ශ්වීය ගිවිසුමක් ලෙස ද දැක්විය හැක.

(ආ) ISO ......................... පරිසර කළමනාකරණයට අදාළ වන අතර ISO 22000 ......................... සුරක්ෂිතතා කළමනාකරණයට අදාළ වේ.

Visit EDUHUB

**38.** (අ) තොරතුරු පද්ධතිය හා සම්බන්ධ පුද්ගලයින් ............................... ලෙස ද, ස්ථිර ලෙස උපකරණයක ගබඩා කර ඇති මෘදුකාංග ....................... ලෙස ද හැඳින්වේ.

(ආ) රැකියාවෙන් ඉවත්වීම ............................... විසින් සිදු කරන කාර්යයක් වන අතර රැකියාවෙන් පහ කිරීම............................... විසින් සිදු කෙරේ.

**39.** (අ) සංවිධානයක රැකියා පුරප්පාඩු පිරවීම ......................... සහ ......................... පුද්ගලයින් මගින් සිදු කළ හැකිය.

(ආ) සාමාන්‍ය සේවා කාලය සඳහා සේවකයන්ට කරනු ලබන ගෙවීම .................... වන අතර ඊට අමතර සේවා කාලය සඳහා කරනු ලබන ගෙවීම ......................... වේ.

**40.** (අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයක, සැපයුම්කරුවන්ට මුදල් ගෙවීම ................. ක්‍රියාකාරකමක් වන අතර ස්ථාවර වත්කම් මිලට ගැනීම ................................. ක්‍රියාකාරකමකි.

(ආ) කොළඹ කොටස් හුවමාරුවේ පූර්ණ උප සමාගමක් වන මධ්‍යම තැන්පතු පද්ධති (පුද්ගලික) සමාගම, වෙළඳපොළ ....................... සහ ....................... මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කරයි.

- අංක **41** සිට **50** තෙක් ප්‍රශ්නවලට **සුදුසු පිළිතුරු** සපයන්න.

**41.** ව්‍යාපාර සඳහා රජයෙන් ලැබෙන සහාය සහ මඟපෙන්වීම ව්‍යාපාරිකයෙකුට වැදගත් වන ආකාර **හතරක්** දක්වන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(3) ..............................................................................................................

(4) ..............................................................................................................

**42.** පළාත් පාලන ආයතන යටතේ පවතින ව්‍යාපාරවල ලක්ෂණ **හතරක්** ලියන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(3) ..............................................................................................................

(4) ..............................................................................................................

**43.** ව්‍යාපාරයකට අවශ්‍ය වන ප්‍රධාන සම්පත් **හතරක්** නම් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(3) ..............................................................................................................

(4) ..............................................................................................................

**44.** හිමිකාරිත්වය අනුව සංස්ථාපිත හා සංස්ථාපිත නොවන ව්‍යාපාර වර්ග **දෙක** බැගින් සඳහන් කරන්න.

| සංස්ථාපිත | සංස්ථාපිත නොවන |
|---|---|
| (1) ................................................ | (1) ................................................ |
| (2) ................................................ | (2) ................................................ |

**45.** සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, මහා පරිමාණ ව්‍යාපාරවලින් වෙන්කර හඳුනාගත හැකි සාධක **හතරක්** දක්වන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(3) ..............................................................................................................

(4) ..............................................................................................................

Visit EDUHUB

**46.** ව්‍යාපාර සඳහා භාවිත කළ හැකි පරිගණක ජාල වර්ග **හතරක්** නම් කරන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

(3) ..............................................................................................

(4) ..............................................................................................

**47.** පහත දී ඇති එක් එක් ප්‍රකාශය පදනම් කරගෙන ඊට අදාළව ව්‍යාපාරය කෙරෙහි උනන්දුව දක්වන පාර්ශ්වය නම් කරන්න.

| ප්‍රකාශය | උනන්දුව දක්වන පාර්ශ්වය |
|---|---|
| 1. ආයෝජනයට ලැබෙන ප්‍රතිලාභය පසුගිය වසරට වඩා ඉහළ ය. | 1. ........................................ |
| 2. වෙනත් ආයතනයන්ට සාපේක්ෂව මෙම ආයතනයෙන් මිල දී ගන්නා භාණ්ඩ සඳහා ඉහළ වටිනාකමක් හිමි වේ. | 2. ........................................ |
| 3. භාණ්ඩ මිල කිරීම හා අලෙවි උපක්‍රම පිළිබඳ ඉහළ අවධානයක් යොමු කිරීම වැදගත් වේ. | 3. ........................................ |
| 4. මෙම ආයතනය සේවක රැකියා සුරක්ෂිතතාවය තහවුරු කර ඇත. | 4. ........................................ |


**48.** පටු පාලන අවකාශය සමඟ සැසඳීමේ දී පුළුල් පාලන අවකාශයෙහි ඇති වාසි හා අවාසි **දෙක** බැගින් ලියන්න.

| වාසි | අවාසි |
|---|---|
| (1) ........................................ | (1) ........................................ |
| (2) ........................................ | (2) ........................................ |

**49.** විද්‍යුත් අලෙවිකරණය මගින් ව්‍යාපාරිකයාට සහ පාරිභෝගිකයාට ඇති විය හැකි අවස්ථාවක් හා තර්ජනයක් බැගින් ලියන්න.

| | ව්‍යාපාරිකයාට | පාරිභෝගිකයාට |
|---|---|---|
| අවස්ථාව | ........................................ | ........................................ |
| තර්ජනය | ........................................ | ........................................ |

**50.** පහත දී ඇති නිෂ්පාදන ජීවන චක්‍රයේ සඳහන් 1, 2, 3 සහ 4 යන අවස්ථා නම් කරන්න.




(1) ..............................................................................................

(2) ..............................................................................................

(3) ..............................................................................................

(4) ..............................................................................................

Visit EDUHUB

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2021 (2022)

| විෂය අංකය பாட இலக்கம் | 32 | විෂයය பாடம் | ව්‍යාපාර අධ්‍යයනය |
|---|---|---|---|

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 2 | 21. | 2 |
| 02. | 2 | 12. | 4 | 22. | 4 |
| 03. | 5 | 13. | 3 | 23. | 3 |
| 04. | 2 | 14. | 5 | 24. | 1 |
| 05. | 1 | 15. | 1 | 25. | 4 |
| 06. | 2 | 16. | 2 | 26. | 3 |
| 07. | 4 | 17. | 4 | 27. | 3 |
| 08. | 5 | 18. | 3 | 28. | 5 |
| 09. | 5 | 19. | 4 | 29. | 2 |
| 10. | 2 | 20. | 1 | 30. | 3 |

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 02 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 30 = 60

Visit EDUHUB

**31 සිට 50 දක්වා සෑම පිළිතුරකටම ලකුණු $^1/_2$ බැගින් හිමි වේ.**

31. අ) ස්පෘශ්‍ය, අස්පෘශ්‍ය
    ආ) ව්‍යාපාර, වාණිජ්‍ය/වෙළෙඳාම

32. අ) බණ්ඩනය, ස්ථාපිත වීම/පිහිටුවීම
    ආ) පෞද්ගලික, නිෂ්පාදකයා

33. අ) ප්‍රාථමික, ද්විතීයික
    ආ) හිමිකාරීත්ව, ණය

34. 1) විනිමය/ හුවමාරු මාධ්‍යයක් වීම
    2) වටිනාකමේ සන්නිධියක්/ රැස්කිරීමේ මාධ්‍යයක් වීම
    3) විලම්භිත ගෙවීම් මාධ්‍යයක් වීම
    4) වටිනාකම මැනීමේ මිම්මක් වීම

35. අ) සිල්ලර, භෞතික
    ආ) ව්‍යාපාර, රජය

36. අ) තැන්පතු, ණය
    ආ) අග්‍ර/ඉහළ, මධ්‍ය

37. අ) ද්වි, බහු
    ආ) 14001, ආහාර

38. අ) ජීවාංග, ආයතනිකාංග/ ස්ථිරාංග
    ආ) සේවකයා/ සේවාදායකයා, සේව්‍යයා/ සේවා යෝජකයා

39. අ) අභ්‍යන්තර, බාහිර හෝ බාහිර, අභ්‍යන්තර
    ආ) වැටුප/ වේතන, අතිකාල දීමනා

40. අ) මෙහෙයුම්, ආයෝජන
    ආ) අතරමැදි, නිෂ්කාශන

41. 1) ව්‍යාපාර ලියාපදිංචියට යොමු වීම

    4) රජයේ හා මහජනයාගේ පිළිගැනීම ලැබීම
    5) නව වෙළෙඳපල අවස්ථා හඳුනා ගැනීම සඳහා උපකාරී වීම
    6) නව නිෂ්පාදන අවස්ථා හඳුනා ගැනීම සඳහා සහය වීම

Visit EDUHUB

42. 1) පළාත් සභා, නගර සභා, ප්‍රාදේශීය සභා, යටතේ පවත්වා ගෙන යාම

2) අයිතිය ඒ ඒ පළාත් පාලන ආයතනයට හිමි වීම

3) අවශ්‍ය අරමුදල් පළාත් පාලන ආයතනය විසින් හෝ මධ්‍යම රජයෙන් සපයනු ලැබීම

4) පරිපාලනය පළාත් පාලන අධිකාරීන් විසින් සිදු කිරීම

43.

| | | |
|---|---|---|
| 1. භූමිය | | 1. මූල්‍ය |
| 2. ශ්‍රමය | | 2 මානව |
| 3. ප්‍රාග්ධනය | හෝ | 3. භෞතික |
| 4. ව්‍යවසායකත්වය | | 4. ව්‍යවසායකත්වය |
| 5. තොරතුරු | | |
| 6. කාලය | | |
| 7. දැනුම | | |

44.

| සංස්ථාපිත | සංස්ථාපිත නොවන |
|---|---|
| පොදු/පුද්ගලික සමාගම් | කේවල ස්වාමි ව්‍යාපාර |
| රාජ්‍ය සමාගම් | හවුල් ව්‍යාපාර |
| සමුපකාර | |

45. 1. ආයෝජිත ප්‍රාග්ධන ප්‍රමාණය
2. සේවක සංඛ්‍යාව
3. භාවිතා කරන බල ශක්ති ඒකක ප්‍රමාණය
4. වාර්ෂික පිරිවැටුම
5. ව්‍යාපාර ව්‍යුහය
7. භාවිතා කරන තාක්ෂණය
8. වෙළඳපොළ ස්වභාවය
9. ව්‍යාපාර හිමිකාරිත්වය

2. පුළුල් ක්ෂේත්‍ර ජාල WAN
3. පුද්ගල ක්ෂේත්‍ර ජාල PAN
4. නාගරික ක්ෂේත්‍ර ජාල MAN
5. රැහැන් රහිත ප්‍රාදේශීය ක්ෂේත්‍ර ජාල WLAN
6. Virtual Private Network (VPN)

Visit EDUHUB

47. 1. අයිතිකරුවන්/ ආයෝජකයන්

2. ගණුදෙණුකරුවන්/ පාරිභෝගිකයන්

3. කළමණාකරුවන්

4. සේවකයන්

48.

| වාසි | අවාසි |
|---|---|
| 1. තීරණ ගැනීම වේගවත්ය | 1. සේවක උසස් වීම් අවස්ථා අවම වීම |
| 2. සුපරීක්ෂණය පහසු වීම | 2. වැඩි නිදහස නිසා සේවක විනය පිරිහීම |
| 3. පිරිවැය අඩු වීම | 3. සේවක ඇගයීම අපහසු වීම |
| 4. සන්නිවේදනය පහසු වීම | 4. සම්පත් භාවිතය අකාර්යක්ෂම වීම |
| 5. සම්බන්ධීකරණය පහසු වීම | |
| 6. දැනුම බෙදාගැනීම පහසු වීම | |

49.

| | ව්‍යාපාරිකයාට | පාරිභෝගිකයාට |
|---|---|---|
| **අවස්ථාව** | 1. වෙළෙඳපොල ගෝලීය වශයෙන් ව්‍යාප්ත වීම<br>2. අතරමැදියන් නොමැති වීමෙන් පිරිවැය අඩු වීම<br>3. වෙළෙඳපොළ තොරතුරු පහසුවෙන් ලබා ගත හැකි වීම<br>4. පුද්ගලික අලෙවිය වැඩි වීම | 1. පැය 24 පුරා ගණු දෙණු කළ හැකි වීම<br>2. පහසුවෙන් හා ඉක්මනින් ඇණවුම් කළ හැකි වීම<br>3. භාණ්ඩ තෝරා ගැනීමට පුළුල් ඉඩකඩක් තිබීම<br>4. සාපේක්ෂව මිල ගණන් අඩු වීම |
| **තර්ජනය** | 1. දැඩි තරගකාරිත්වය<br>2. තාක්ෂණික පහසුකම් අවම වීම<br>3. සෘණාත්මක ඇගයීම් | 1. වංචා හා දූෂණ ඇති වීම<br>2. ආරක්ෂාව පිළිබඳව ගැටලු ඇති වීම<br>3. ගෙවීම් කිරීමේදී ගැටලු මතු වීම<br>4. නොමග යවන තොරතුරු ඉදිරිපත් විය |

50. 1. වර්ධන

2. පරිණත

3. පිරිහෙන

4. නැවත වර්ධන

Visit EDUHUB

## I කොටස

1. සීමාසහිත ඔටෝ මොබයිල් සමාගම ශූන්‍ය විමෝචන (zero-emission) මෝටර් රථ එකලස් කර ශ්‍රී ලංකාව තුළ අලෙවි කරයි. සමාගම තුළ විශාල සේවක සංඛ්‍යාවක් සේවය කරන නමුත් එක් සේවකයකු නියුක්ත වන්නේ එක් කාර්යයක් සඳහා පමණි. මීට අමතරව, සමාගම විසින් පාරිභෝගිකයින් සඳහා අලෙවියෙන් පසු සේවාවන් ද සපයනු ලැබේ. තවද, සමාගම මෙම වසරේ දී වාහන අමතර කොටස් නිෂ්පාදනය ආරම්භ කරන ලදී. මෙම සමාගම වාර්ෂිකව රජයට විශාල ආදායම් බදු මුදලක් ගෙවන අතර ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධනයට ද දායක වේ.

(i) (අ) සමාගම විසින් පාරිභෝගිකයින් වෙත සපයන නිෂ්පාදිත **දෙක** නම් කර, ඒවාට උදාහරණ දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) ආර්ථිකයේ පැවැත්ම සඳහා ඉහත සමාගම දායක වී ඇති ආකාර **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

01.(i) අ). **භාණ්ඩ**

උදා: මෝටර් රථ

මෝටර් රථ අමතර කොටස්

**සේවා**

උදා: අලෙවි කිරීම/ විකිණීම

අලෙවියෙන් පසු සේවා

*(කරුණු 02ට ලකුණු 01*

*උදාහරණ 02ට ලකුණු 01)*

ආ)

1. ජාතික නිෂ්පාදිතයට දායක වීම
2. රැකියා අවස්ථා ඇති කිරීම
3. රජයේ බදු ආදායම වැඩි කිරීම
4. යටිතල පහසුකම් සංවර්ධනයට දායක වීම
5. නවෝත්පාදන

*(එක් කරුණකට ½ බැගින් කරුණු 04ට ලකුණු 02)*

(ii) (අ) ඉහත සිද්ධිය ඇසුරෙන්, සමාගමේ ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපෑම් ඇතිකළ හැකි බලවේග **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාර ලාභ අරමුණු කරගත යුත්තේ ඇයි දැයි හේතු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ii) අ)

1. අයිතිකරුවන්
2. සේවකයන්
3. රජය
4. ණයදෙනු කරුවන්
5. ස්වාභාවික පරිසරය
6. සැපයුම්කරුවන්

Visit EDUHUB

*(එක් කරුණකට ½ බැගින් කරුණු 04ට ලකුණු 02)*

ආ)

1. ව්‍යාපාර සංවර්ධනයට/ ප්‍රති ආයෝජනයට/ ව්‍යාපාර වල අඛණ්ඩ පැවැත්මට
2. ආයෝජකයන්ට ප්‍රතිලාභ ලබා දීමට
3. සේවකයන්ට ප්‍රතිලාභ ලබා දීමට

*(කරුණු 01ක් පැහැදිලි කිරීමට ලකුණු 01 බැගින් කරුණු 02ට ලකුණු 02)*

(iii) (අ) අලෙවියෙන් පසු සේවාවට අමතරව මෙම සමාගම මගින් පාරිභෝගිකයන් හට සැපයිය හැකි වෙනත් සේවා **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) ''එක් සේවකයකු නියුක්ත වන්නේ එක් කාර්යයක් සඳහා පමණි.'' යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි පැහැදිලි කර, එමගින් ව්‍යාපාරයට ලබාගත හැකි වාසි **දෙකක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iii) අ)

1. රක්ෂණ පහසුකම්
2. මූල්‍ය/ ණය පහසුකම්
3. ප්‍රවාහන පහසුකම්

*(කරුණු 01ක් පැහැදිලි කිරීමට ලකුණු 01 බැගින් කරුණු 02ට ලකුණු 02)*

ආ) ශ්‍රම විභජනය

*(ලකුණු 01)*

වාසි :

1. විශේෂ ප්‍රාගුන්‍ය ඇති වීම
2. නිෂ්පාදිත ප්‍රමාණය වැඩි වීම
3. නිෂ්පාදිත ඒකකවල පිරිවැය අඩු වීම
4. නවෝත්පාදනයට යොමු වීම

*(වාසි එකකට ලකුණු 01 බැගින් ලකුණු 02)*

(iv) සමාජ වගකීම් ඉටුකිරීමෙන් මෙම සමාගමට ලබාගත හැකි ප්‍රතිලාභ **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

(iv)

1. ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු වීම
2. ව්‍යාපාරයේ ප්‍රතිරූපය/ කීර්ති නාමය වර්ධනය වීම
3. ව්‍යාපාරය පිළිබඳ විශ්වාසය තහවුරු වීම

5. ව්‍යාපාරයේ අරමුණු හා පරමාර්ථ ලඟා කර ගැනීමට පහසු වීම
6. වෙළෙඳපල පුළුල් වීම
7. තරඟකාරීත්වයට මුහුණ දීමට හැකි වීම
8. ආයෝජන ලබා ගැනීමට හැකි වීම

Visit EDUHUB

*(කරුණු 3ක් පැහැදිලි කිරීමට ලකුණු 03)*

(v) පාරිසරික තිරසර සංවර්ධනය සඳහා මෝටර් රථ නිෂ්පාදකයින්ට දායක විය හැකි ආකාර **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(v)

1. පරිසර හිතකාමී ප්‍රතිපත්ති ඇති කර ගැනීම
2. විදුලි බලයෙන් ක්‍රියාත්මක වන වාහන නිපදවීම
3. බරින් අඩු වාහන නිෂ්පාදනය/ ඉන්ධන කාර්යක්ෂමතාවය
4. අපද්‍රව්‍ය හා අමුද්‍රව්‍ය කළමනාකරණය/ අමු ද්‍රව්‍ය නැවත භාවිතය හා ප්‍රතිචක්‍රීකරණය
5. පුනර්ජනනීය බල ශක්තියෙන් ධාවනය වන වාහන නිපදවීම (උදාහරණ: හිරු එළිය වැනි ස්වාභාවික බල ශක්ති ක්‍රම)

***(කරුණු 04ක් පැහැදිලි කිරීමට ලකුණු 04)***

**2.** ශාලිකා මහත්මිය ඇයගේ ඇඟලුම් නිෂ්පාදන ව්‍යාපාරය පිළිබඳව දැක්වූ අදහස් කිහිපයක් පහත වේ.

"අඩු මුදලක් ආයෝජනය කර ආරම්භ කරන ලද මගේ ව්‍යාපාරය අභියෝගාත්මක වුවත් එය පවත්වා ගැනීමේ දී සීමිත නීතිරීති ප්‍රමාණයකට පමණක් යටත් වේ. ව්‍යාපාරය පිළිබඳ සියලුම තීරණ ගැනීම මෙන් ම වගකීම් ද මා විසින් දැරිය යුතු ය. හවුල් ව්‍යාපාරයක් ලෙස මෙම ව්‍යාපාරය පරිවර්තනය කිරීමට මම අදහස් කළත් මගේ ගණකාධිකාරවරයා පැවසුවේ සීමාසහිත පුද්ගලික සමාගමක් ලෙසට ලියාපදිංචි කිරීම යෝග්‍ය බව ය."

(i) (අ) හිමිකාරිත්වය අනුව ඉහත ව්‍යාපාරය කුමන ව්‍යාපාර වර්ගයකට අයත් වන්නේ දැයි සඳහන් කරන්න. (ලකුණු 01 යි)

(ආ) ඉහත (අ) හි දක්වන ලද වර්ගීකරණය සඳහා පාදක වූ හේතු **තුනක්** සිද්ධිය ඇසුරෙන් දක්වන්න. (ලකුණු 03 යි)

(i) අ) පුද්ගලික/ පෞද්ගලික

***(ලකුණු 01)***

ආ)

1. ශාලිකා විසින්ම මුදල් ආයෝජනය කර තිබීම
2. ඇය විසින් තීරණ ගැනීම
3. වගකීම් තනිව දැරීම/ අවදානමට තනිව මුහුණ දීම
4. ප්‍රතිලාභ තනිවම භුක්ති විඳීම

***(කරුණු 3ට ලකුණු 03)***

(ii) (අ) ශාලිකා තම ව්‍යාපාරය 'වියානා ටෙක්ස්ටයිල්ස්' නමින් ලියාපදිංචි කිරීමට අදහස් කරන්නේ නම් අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) ශාලිකාගේ ව්‍යාපාරයට අරමුදල් සපයාගත හැකි අභ්‍යන්තර හා බාහිර මූලාශ්‍රය බැගින් නම් කර, ඒවායේ ඇති එක් වාසිය බැගින් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) අ)

1. අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කේවල ස්වාමි ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම සඳහා වූ අයදුම් පත්‍රය ලබා ගැනීම

Visit EDUHUB

2. ග්‍රාම නිලධාරියාගෙන් ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම සඳහා වූ වාර්තාව ලබා ගැනීම
3. ග්‍රාම නිලධාරී සහතික කළ වාර්තාව සහ ඉල්ලුම් පත්‍රය අදාළ ගාස්තු සමග ප්‍රාදේශීය ලේකම් වෙත භාර දීම
4. ප්‍රාදේශීය ලේකම් විසින් ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කිරීම

*(එක් ක්‍රියා පටිපාටියකට ලකුණු ½ X 4 බැගින් ලකුණු 02 )*

ආ) අභ්‍යන්තර -

1. රඳවා ගත් ලාභ
2. ක්ෂය වෙන් කිරීම්
3. අතිරික්ත වත්කම් විකිණීම

*(කරුණු 1ට ලකුණු ½ )*

වාසි

1. පිරිවැය අඩු වීම
2. ලබා ගැනීම පහසු වීම
3. ආපසු ගෙවීමක් නොමැති වීම
4. වගකීම් වැඩි නොවීම
5. විශේෂ කොන්දේසි වලට යටත් වීමට සිදු නොවීම

*(වාසි එකකට ලකුණු ½ )*

බාහිර -

1. බැංකු ණය
2. කල් බදු
3. බැංකු අයිරා
4. කුලී පිට ගැණුම්

*(කරුණු 1ට ලකුණු ½ )*

වාසි

1. විශාල අරමුදල් ප්‍රමාණයක් සපයා ගත හැකි වීම
2. අවශ්‍ය ඕනෑම විටෙකදී ලබා ගත හැකි වීම
3. ආදායම් බදු ගණනය කිරීමේදී සහන ලබා ගත හැකි වීම

*(කරුණු 1ට ලකුණු ½ )*

(iii) (අ) ශාලිකාගේ ව්‍යාපාරයේ ඇති සීමාවන් **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) ශාලිකා තම නිෂ්පාදන විකිණීම සඳහා අලෙවිසැලක් ආරම්භ කිරීමට අදහස් කරන්නේ නම් එය කුමන ව්‍යාපාර සංයෝජන වර්ගයකට අයත් වන්නේ දැයි නම් කර, කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(iii) අ)

1. අයිතිකරුගේ අසීමිත වගකීම
2. ප්‍රාග්ධනය සපයා ගැනීමේ දුෂ්කරතා

Visit EDUHUB

3. නෛතික පුද්ගලභාවයක් නොමැති වීම
4. අයිතිකරු තනිවම ගන්නා තීරණ අසාර්ථක වීමට හැකි වීම
5. අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම
6. ව්‍යාපාරය පුළුල් වන විට කළමනාකරණය අපහසු වීම
7. අලාභ තනිව භුක්ති විදීමට සිදු වීම

*(එක් කරුණකට ලකුණු ½ බැගින් කරුණු 4ට ලකුණු 02)*

ආ) සිරස් සංයෝජන

*(ලකුණු 01)*

ව්‍යාපාර දාමයේ ඊළඟ ව්‍යාපාර අවස්ථාව වන විකිණීම සඳහා යොමු වීම.

ඇඟලුම් නිෂ්පාදන

↓

ඇඟලුම් අලෙවි කිරීම *(ලකුණු 01)*

(iv) ශාලිකාගේ ව්‍යාපාරය හවුල් ව්‍යාපාරයක් ලෙස පරිවර්තනය කිරීමෙන් ඇයට හිමිවන ප්‍රතිලාභ **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි)

(iv)

1. වඩාත් සාර්ථක තීරණ ගත හැකි වීම
2. වැඩි ප්‍රාග්ධනයක් රැස් කර ගත හැකි වීම
3. කිහිප දෙනෙකුගේ දක්ෂතා හා හැකියා එක් රැස් කර ගත හැකි වීම
4. වගකීම කිහිපදෙනෙකු අතර බෙදී යාම
5. සාමූහික වගකීම නිසා ඇතිවන උනන්දුව හා කාර්යක්ෂමතාව
6. අවධානම බෙදී යාම

*(කරුණකට ලකුණු 01 බැගින් කරුණු 04ට ලකුණු 04)*

(v) (අ) හවුල් ව්‍යාපාරයක් හා සාපේක්ෂව සීමාසහිත පුද්ගලික සමාගමක් ලෙසින් ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමෙන් ඇතිවන වාසි **හතරක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) රාජ්‍ය සංස්ථාවක ඇති ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(V) අ)

2. නීතිමය පුද්ගලභාවයක් හිමි වීම
3. අඛණ්ඩ පැවැත්මක් ලැබීම
4. වගකීම සීමා සහිත වීම
5. ඉහළ මට්ටමේ මානව සම්පත් ලබා ගැනීමට හැකි වීම

*(කරුණකට ලකුණු ½ බැගින් කරුණු 04ට ලකුණු 02)*

Visit EDUHUB

ආ)

1. අයිතිය රජය සතු වීම
2. විශේෂ හෝ පොදු පනතක් යටතේ සංස්ථාපනය කිරීම
3. නෛතික පුද්ගල භාවයක් හිමි වීම
4. ව්‍යවස්ථාදායකයට වග කිව යුතුය
5. රජය මගින් පත් කරන අධ්‍යක්ෂක මණ්ඩලයකින් පාලනය වීම
6. රාජ්‍ය ණය, ලාභාංශ, ප්‍රති ආයෝජන ආදියෙන් ප්‍රාග්ධනය සම්පාදනය කර ගැනීම
7. ජනතාවට කාර්යක්ෂම සේවාවක් සැපයීම ප්‍රධාන අරමුණ වීම

***(කරුණකට ලකුණු ½  බැගින් කරුණු 04ට ලකුණු 02)***

3. (i) (අ) ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා රජය විසින් දෙනු ලබන මූල්‍යමය නොවන දිරිගැන්වීම් **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(ආ) ව්‍යවසායක ප්‍රාග්ධන සමාගමක කාර්ය **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(i) අ)

1. උපදේශන සේවා
2. ව්‍යවසායක සංවර්ධන වැඩසටහන්
3. පර්යේෂණ හා තාක්ෂණික සේවා
4. යටිතල පහසුකම් සැපයීම
5. අලෙවි පහසුකම්/ වෙළෙඳපොළ පහසුකම් ලබා දීම
6. විශිෂ්ටතා සම්මාන ලබා දීම

***(කරුණු 01ට ලකුණු ½ බැගින් කරුණු 04ට ලකුණු 02)***

ආ)

1. නව ව්‍යාපාරිකයන්ගේ ආර්ථික වර්ධනය සඳහා උපදෙස් ලබා දීම
2. නව ව්‍යාපාර ආරම්භ කිරීමට අරමුදල් ලබා දීම
3. ව්‍යාපාර ව්‍යාප්ත කිරීමට අරමුදල් සැපයීම
4. ව්‍යාපාර පවරා ගැනීමට අරමුදල් සැපයීම

6. කොටස් ප්‍රාරක්ෂණය
7. ණය සම්මේලය කිරීම
8. ණය සහ මූල්‍යයනය

***(කරුණු 01ට ලකුණු ½ බැගින් කරුණු 04ට ලකුණු 02)***

Visit EDUHUB

(ii) (අ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය මුදලේ අගය ස්ථාවරව පවත්වා ගැනීමෙන් ව්‍යාපාරවලට ලැබිය හැකි වාසි **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ප්‍රාග්ධන වෙළඳපොළෙහි ප්‍රාථමික අලෙවිකරුවන්ගේ කාර්යභාරයන් **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ii) අ)

1. ව්‍යාපාර කටයුතු සැලසුම් කිරීම පහසු වීම
2. ආයෝජනයට ව්‍යාපාරිකයන් වඩ වඩාත් උනන්දු වීම
3. ආනයන, අපනයන කටයුතු ප්‍රශස්ත ලෙස පවත්වා ගත හැකි වීම
4. ස්ථාවර මිල ප්‍රතිපත්ති පවත්වා ගත හැකි වීම
5. විකුණුම් ආදායම ප්‍රශස්ත මට්ටමක පවත්වා ගත හැකි වීම
6. පිරිවැය ප්‍රශස්ත මට්ටමක පවත්වා ගත හැකි වීම

***(කරුණු 01ට ලකුණු ½ බැගින් කරුණු 4ට ලකුණු 02)***

ආ)

1. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ප්‍රාථමික වෙන්දේසිවලට සහභාගී වීම
2. භාණ්ඩාගාර සුරැකුම්පත් සම්බන්ධයෙන් ද්විතීයික වෙළෙඳපොළේ ගණු දෙනු කිරීම

***(කරුණු 01කට ලකුණු 01 බැගින් ලකුණු 02)***

(iii) (අ) කල්බදු සමාගම් සපයන සේවාවන් තුළින් ව්‍යාපාරිකයකුට ලැබෙන වාසි **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) ස්වයංක්‍රීය බැංකු සේවා මගින් ගනුදෙනුකරුවන් සඳහා අත්වන වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(iii) අ)

1. විශාල වටිනාකමකින් යුත් වත්කම් මුළු මුදලම නොගෙවා භාවිතයට ඉඩකඩ ලැබීම
2. කල්බදු සඳහා ගෙවන කුලිය ආදායම් බද්දෙන් නිදහස් වීම
3. යන්ත්‍ර යල් පැනීම නිසා සිදුවන පාඩු හා ප්‍රාග්ධන අලාභ මඟ හැරීම
4. විශාල මුදලක් ආයෝජනය නොකර වැඩි ආදායමක් ඉපැයීමේ හැකියාව

***(කරුණු 01ට ලකුණු ½ බැගින් කරුණු 4ට ලකුණු 02)***

ආ) <u>වාසි</u>

2. ගිණුමට මුදල් තැන්පත් කිරීම
3. ගිණුමකින් ගිණුමකට මුදල් මාරු කිරීම
4. ගිණුමේ ශේෂය දැනගත හැකි වීම
5. බිල්පත් ගෙවීමේ පහසුකම් තිබීම
6. දවසේ පැය 24ම සේවාවන් ලබා ගත හැකි වීම

Visit EDUHUB

***(වාසි 1කට ලකුණු ½ බැගින් වාසි 02කට ලකුණු 01)***


**අවාසි**

1. තාක්ෂණික දෝෂ ඇති වීම
2. ආරක්ෂාව පිළිබඳ ගැටලු මතු වීම
3. පුද්ගල සබඳතා අවම වීම
4. විශාල මුදල් ප්‍රමාණයන් ගණුදෙණු කළ නොහැකි වීම
5. අමතර පිරිවැයක් දැරීමට සිදු වීම

*(අවාසි 1කට ලකුණු ½ බැගින් වාසි 02කට ලකුණු 01)*

(iv) (අ) චතුර බණ්ඩාර යන අයට ඔබ විසින් රු. 50 000 ක් චෙක්පතකින් ගෙවන්නේ නම්,
(1) උපරිම ආරක්ෂාව සැලසෙන පරිදි එය රේඛනය කරන ආකාරය පෙන්වන්න. (ලකුණු 01 යි)
(2) චෙක්පතක් අගරු වන අවස්ථා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 01 යි)
(ආ) (1) පෙර දාතම යෙදූ චෙක්පතක් නිකුත් කිරීම සඳහා බලපාන හේතුවක් දක්වන්න. (ලකුණු 01 යි)
(2) එවැනි චෙක්පතක් සාමාන්‍ය ගිණුම් හිමියෙකුට එම දිනට පෙර බැංකුවේ තැන්පත් කළ හැකි ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 01 යි)

(iv) අ) 1.




*(ලකුණු 01)*

2.

1.ගිණුමේ ප්‍රමාණවත් මුදල් නොමැති වීම
2.අණකරු විසින් ගෙවීම නතර කර තිබීම
3.අණකරු බුන්වත් වීම
4.අණකරු මරණයට පත්වීම හා ඒ බව බැංකුවට දැනුම් දීම
5.උසාවි නියෝගයක් (ගානිෂී නියෝගයක්) ලැබීම
6.ලිඛිත වැරදි
7.ගිණුම වසා තිබීම
8.චෙක්පතේ කාලය ඉකුත් වීම

*(එක කරුණකට ලකුණු ½ බැගින් කරුණු 02කට ලකුණු 01 )*

ආ) 1.

2.ගෙවීම් ප්‍රමාද කිරීමට අවශ්‍ය වීම

*(එක් කරුණකට ලකුණු 01)*

2. නොහැක. *(ලකුණු ½ )*

නියමිත දිනය තෙක් එම චෙක්පත ගණු දෙණු කළ හැකි ලියවිල්ලක් ලෙස පිළි නොගැනීම

*(ලකුණු ½ )*

Visit EDUHUB

(v) ආනයන තීරුබදු ඉහළ දැමීම තුළින් දේශීය ව්‍යාපාරවලට ඇතිවන වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(v) **වාසි**

1.දේශීය කර්මාන්ත ආරක්ෂා වීම

2.දේශීය ව්‍යාපාරවලට තරග කිරීමේ හැකියාව ඉහළ යාම

3.දේශිය නිෂ්පාදිත සඳහා ඉල්ලුමක් ඇති වීම

***(වාසි 02කට ලකුණු 02)***

**අවාසි**

1. ඇතැම් ආනයනික අමු ද්‍රව්‍ය වල මිල ඉහළ යාම නිසා පිරිවැය වැඩි වීම
2. විකුණුම් ආදායම/ විකුණුම් පිරිවැටුම පහළ යාම

***(අවාසි 02කට ලකුණු 02)***

**4.** (i) (අ) රජය විසින් අවම වැටුපක් නියම කිරීමෙන් සේවකයින් සඳහා ලැබෙන ප්‍රතිලාභ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) ණයවර ලිපියක් තුළින් අපනයනකරුවකුට ලැබෙන වාසි **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

(i) අ)

1. නිශ්චිත වැටුපක් ලැබෙන බවට සහතික වීම/ නීතිමය ආවරණයක් හිමි වීම
2. නිශ්චිත වැටුපක් ලබා ගැනීමට පදනමක් හිමි වීම
3. විධිමත් වැටුප් ක්‍රමයක් සකස් කළ හැකි වීම
4. එක සමාන රැකියා ක්ෂේත්‍ර සඳහා සමාන වැටුප් ක්‍රමයක් නිර්මාණය වීම
5. ශ්‍රම සූරා කෑමට, අසාධාරණයට ලක් වීමට ඉඩකඩ නොමැති වීම

***(කරුණු 02කට ලකුණු 02)***

ආ)

1. අපනයනය කරනු ලබන භාණ්ඩවලට මුදල් ලැබීම තහවුරු වීම
2. ණයවර ලිපියට අදාල කොන්දේසි ආනයනකරුට වෙනස් කළ නොහැකි වීම
3. අපනයන අත්තිකාරම් මුදලක් ලබා ගත හැකි වීම
4. ආනයනකරුට, අපනයනකරු කෙරෙහි විශ්වාසයක් ඇති වීම

***(වාසි 02කට ලකුණු 02)***

Visit EDUHUB

(ii) (අ) හර පතක් සහ බැර පතක් අතර ඇති අසමානකම් **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)
(ආ) ඩිජිටල් මුදල්වල ඇති වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(i) අ)

| හරපත | බැරපත |
|---|---|
| 1. හරපතක් ලබා ගැනීමට ගිණුමක් අවශ්‍ය වීම | 1. ගිණුමක් අවශ්‍ය නොවීම |
| 2. ගිණුමේ පවතින මුදල් ශේෂය මත ගණුදෙණු කිරීම | 2. ණය පදනම මත ගණු දෙණු සිදු වීම |
| 3. ලබා ගැනීමට විශේෂ සුදුසුකම් අවශ්‍ය නොවේ | 3. ලබා ගැනීමට විශේෂ සුදුසුකම් අවශ්‍ය වේ. |
| 4. ගණුදෙණු සම්බන්ධව පිරිවැයක් නොමැත. (පොලී අය කිරීමක් නොමැත.) | 4. ප්‍රමාද ගාස්තු, පොලී ගෙවීමට සිදු වීම |

***(අසමානකම් 02කට ලකුණු 02)***

ආ). **වාසි**

1. ගෙවීම් කටයුතු වේගවත් වීම
2. භෞතික මුදල් අවශ්‍යතාවක් නොමැති වීම
3. ගණුදෙණු කිරීමේදී පිරිවැය අවම වීම
4. මුදලේ ආරක්ෂාව තහවුරු වීම

***(වාසි එකකට ලකුණු ½ බැගින් දෙකකට ලකුණු 01)***

**අවාසි**

1. වංචනික ක්‍රියා සිදුවීමට ඉඩ ඇත.
2. මුදලේ වටිනාකම වෙනස් විය හැක.
3. මුදලේ ආරක්ෂාව පිළිබඳ ගැටළු සහ සයිබර් තර්ජන වලට ලක් විය හැක. (Cyber attacks)
4. නීතිමය බාධා/ අඩු පාඩු පැවතීම

***(අවාසි එකකට ½ බැගින් දෙකකට ලකුණු 01)***

(iii) (අ) විද්‍යුත් වෙළෙඳාම භාවිතයෙන් භාණ්ඩයක් අලෙවි කිරීමේ දී ගතයුතු ක්‍රියාපටිපාටිය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 යි)
(ආ) සිල්ලර වෙළෙඳාමට නව තාක්ෂණය භාවිත කළ හැකි ආකාර **දෙකක්** දක්වා, ඒ සඳහා උදාහරණය බැගින් සපයන්න. (ලකුණු 02 යි)

(iii) අ).

1. අන්තර්ජාලය ඔස්සේ ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් සම්මුඛ වීම
2. වෙළඳ ගණුදෙණුව සංවිධානය කර ගැනීම
3. භාණ්ඩ විකිණීම හා මිලට ගැනීමේ කටයුතු සිදුවීම
4. ගණුදෙනුවට අදාළ ගෙවීම් කටයුතු පියවීම

***(එක කරුණකට ලකුණු ½ බැගින් කරුණු 04ට ලකුණු 02)***

Visit EDUHUB

ආ).

1. මිල සටහන් කිරීම - Bar code, QR code
2. කිරුම් මිනුම් ක්‍රම - විද්‍යුත් තරාදි (Digital Scale)
3. ගෙවීම් ක්‍රම - හරපත්, ණයපත් භාවිතය
4. නිරීක්ෂණ ක්‍රම - CCTV Camera system
5. ආරක්ෂාව - RFID (Radio frequency identification) ගුවන් තරංග මගින් භාණ්ඩ හඳුනා ගැනීම

***(එක් කරුණකට ½ බැගින් කරුණු 02කට ලකුණු 01 උදාහරණ එකකට ½ බැගින් උදාහරණ දෙකකට ලකුණු 01)***

(iv) (අ) තොරතුරු සන්නිවේදනයේ දී කළමනාකරුවකු විසින් කාර්ය මණ්ඩලය සමග රැස්වීම් පැවැත්වීමෙන් ඇතිවන වාසි **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) ප්‍රධාන අරමුණු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(IV) අ). <u>**වාසි**</u>

1. විස්තරාත්මක තොරතුරු ලබා දිය හැකි වීම
2. තොරතුරු දෙන්නා හා ලබන්නා සම්මුඛ වීම
3. තොරතුරු ඉතාමත් ඉක්මනින් ලබා දිය හැකි වීම
4. අංග චලනයෙන් ප්‍රතිචාර දැක්විය හැකි වීම
5. ක්ෂණිකව ප්‍රතිචාර දැන ගත හැකි වීම

***(වාසි එකකට ලකුණු 01 බැගින් වාසි 02කට ලකුණු 02)***

ආ).

1. ගෝලීය සහයෝගීතාවය දියුණු කිරීම
2. මූල්‍ය ස්ථායීතාව සහතික කිරීම
3. ජාත්‍යන්තර වෙළෙඳාමට පහසුකම් සැලසීම
4. රැකියා අවස්ථා පුළුල් වීම
5. තිරසර ආර්ථික සංවර්ධනය
6. දුප්පත්කම අඩු කිරීම

***(කරුණු එකකට ලකුණු ½ බැගින් කරුණු 04කට ලකුණු 02)***

(v) ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීම සඳහා යෝජනා **හතරක්** උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

2. රේගු නීති රීති ලිහිල් කිරීම
3. වෙළෙඳ සල්පිල් හා ප්‍රදර්ශන පැවැත්වීම
4. වාසිදායක වන සේ වෙළඳ ගිවිසුම් ඇති කර ගැනීම
5. ජාත්‍යාන්තර වෙළෙඳපොළට ගැලපෙන සේ භාණ්ඩවල ගුණත්වය වර්ධනය කිරීම
6. විදේශ වෙළෙඳාම ප්‍රවර්ධනය සඳහා රාජ්‍ය වෙළෙඳ ප්‍රතිපත්ති සකස් කිරීම
7. විවිධ දිරිගැන්වීම් ක්‍රම ක්‍රියාත්මක කිරීම (මූල්‍ය දිරිගැන්වීම් වැනි)

Visit EDUHUB

***(කරුණු 04කට ලකුණු 04)***

## II කොටස

5. කළමනාකරණය යනු 'ගතික පරිසරය තුළ ව්‍යාපාරික පරමාර්ථ සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සීමිත සම්පත් ඵලදායී හා කාර්යක්ෂම ලෙස භාවිත කරමින් විවිධ පුද්ගලයින් සමඟ එක්ව වැඩ කිරීමේ ක්‍රියාවලියයි.'

(i) (අ) ඉහත නිර්වචනය තුළ අන්තර්ගත කළමනාකරණ සංකල්ප **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාරයක පරමාර්ථ සහ අරමුණු අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(i) අ)

1. ගතික ව්‍යාපාර පරිසරය
2. පරමාර්ථ හා අරමුණු
3. ව්‍යාපාර සම්පත්
4. කාර්යක්ෂමතාවය
5. ඵලදායීතාවය
6. විවිධ පුද්ගලයින් සමඟ එක්ව වැඩ කිරීම
7. ක්‍රියාවළිය

***(එකකට ලකුණු ½ බැගින් කරුණු 04කට ලකුණු 02)***

ආ). ආයතනයක් දිගු කාලයකදී ළඟා කර ගැනීමට අපේක්ෂිත ප්‍රතිඵල පරමාර්ථ වන අතර එවැනි පුළුල් වූ ආයතනික පරමාර්ථයකට අදාළ ප්‍රතිඵලය වඩාත් නිශ්චිත ආකාරයෙන් ප්‍රකාශ කිරීම අරමුණ නම් වේ.

**<u>හෝ</u>**

අරමුණු නිශ්චිතය. මැනිය හැක. ළඟා කර ගත හැක. යථාර්තවාදී වීම, කාලරාමුවක් දැකිය හැකි අතර පරමාර්ථ දිගුකාලීන වේ.

***(අදාල ඕනෑම වෙනසකට ලකුණු 02)***

(ii) (අ) ඉදිරි පෙළ කළමනාකරුවන් සඳහා තාක්ෂණික කුසලතා වඩාත් වැදගත් වන්නේ ඇයි දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ආ) පහළ කළමනාකරුවන් වෙත බලතල පැවරීමෙන් ආයතනයේ කළමනාකරණයට ලබාගත හැකි ප්‍රතිලාභ **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ii) අ). ආයතනයේ මෙහෙයුම් සේවකයන් හා පාරිභෝගිකයන් සෘජුවම කටයුතු කරන්නේ ඉදිරි පෙළ කළමනාකරුවන් සමඟ වන අතර ඔවුන් තීරණ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී වැඩිපුර සම්බන්ධ වේ. එම නිසා අදාළ කාර්යයක් කිරීමට තාක්ෂණික කුසලතා වැදගත් වේ.

***කුණු 02)***

ආ).

1. පහළ කලමනාකරුවන් අභිප්‍රේරණය වීම
2. ඉහළ කලමනාකරුවන්ගේ කාර්යභාරය අඩු වීම
3. පහළ කලමනාකරුවන්ගේ වෘත්තිය සංවර්ධනයක් ඇති වීම
4. වඩාත් ගුණාත්මක තීරණ ගත හැකි වීම

Visit EDUHUB

5. පහසුවෙන් තීරණ ක්‍රියාත්මක කළ හැකි වීම
6. පහළ කලමනාකරුවන් බල ගැන්විය හැකි වීම.

***(එක් කරුණකට ලකුණු ½ බැගින් කරුණු 04කට ලකුණු 02)***

(iii) (අ) සඵලදායී සැලසුම්කරණය ව්‍යාපාරයකට වැදගත් වන ආකාර **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) කළමනාකරුවකුට බලය ලැබෙන මූලාශ්‍ර **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) අ).

1. අනාගත අවිනිශ්චිතතා වලට හා ගතික පරිසරයට සාර්ථකව මුහුණ දිය හැකි වීම
2. සම්පත් උපරිම කාර්යක්‍ෂමතාවයෙන් යොදා ගත හැකි වීම
3. පාලනයට පහසුකම් සැලසීම
4. කලමනාකරුවන්ට අනාගතය ගැන සිතීමට අවස්ථාව සැලසීම
5. අනෙකුත් කලමනාකරණ කාර්යයන්ට මගපෙන්වීම හා සම්බන්ධීකරණය කිරීම
6. ආයතනයේ අඛණ්ඩ පැවැත්ම හා වර්ධනය තහවුරු කිරීම
7. වර්තමාන හා අනාගත තරඟකාරීත්වය ඇගයීම
8. වෙනත් පාර්ශව දිරිගැන්වීමට

***(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු 02කට ලකුණු 02)***

ආ).

1. අධිකාරී බලය
2. විශේෂඥ බලය
3. ත්‍යාග දීම සඳහා ඇති බලය
4. දඬුවම් දීමට ඇති බලය
5. බලපෑම් කිරීමේ බලය

***(එක් කරුණකට ලකුණු ½ බැගින් කරුණු 04කට ලකුණු 02)***

(iv) තිලක්ෂිගේ ව්‍යාපාරය හා සම්බන්ධව පහත තොරතුරු දී ඇත.

- උපරිම ද්‍රව්‍ය පරිභෝජනය - දිනකට ඒකක 200යි.
- අවම ද්‍රව්‍ය පරිභෝජනය - දිනකට ඒකක 120යි.
- යළි ඇණවුම් කිරීමේ කාලය - අවමය දින 10 ක් හා උපරිමය දින12කි.
- යළි ඇණවුම් ප්‍රමාණය - ඒකක 1600 කි.

පහත දෑ ගණනය කරන්න.

(අ) යළි ඇණවුම් මට්ටම

(ආ) අවම තොග මට්ටම

(ඉ) උපරිම තොග මට්ටම

(ඊ) සාමාන්‍ය තොගය (ලකුණු 04 යි)

Visit EDUHUB

(iv) අ). ඒකක 2400 *(ලකුණු 01)*

ආ). ඒකක 640 *(ලකුණු 01)*

ඉ). ඒකක 2800 *(ලකුණු 01)*

ඊ) ඒකක 160 *(ලකුණු 01)*

(v) වෙළෙඳපොළේ ඇති පරිගණක වර්ග පහක් ඇසුරෙන් එක් පරිගණකයක් මිලදී ගැනීම සඳහා කළමනාකරුවකු ලෙස ඔබගේ තීරණගැනීමේ ක්‍රියාවලිය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(v)

1. ගැටළුව හඳුනා ගැනීම, උදා. පරිගණක අවශ්‍යතාව හඳුනා ගැනීම
2. ගැටළුව විශ්ලේෂණය කිරීම, උදා. පරිගණක වර්ග පිළිබඳව තොරතුරු රැස් කිරීම
3. විකල්ප විසඳුම් ගොඩ නැගීම, උදා. ඒ ඒ පරිගණක වර්ග වෙන වෙනම සැසඳීම
4. විකල්ප ඇගයීම, උදා. එම සැසඳීම් ඇගයීමට ලක් කිරීම
5. හොඳම විකල්පය තෝරා ගැනීම, උදා. වඩාත් සුදුසු පරිගණකය තෝරා ගැනීම
6. ක්‍රියාත්මක කිරීම, උදා. අදාල පරිගණකය මිලදී ගැනීම

***(කරුණු 1 හා 6 ඇතුලුව කරුණු 04කට ලකුණු 04)***

6. (i) (අ) නිෂ්පාදන ක්‍රමයක් තෝරාගැනීමේ දී අවධානය යොමුකළ යුතු නිර්ණායක **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) ප්‍රවාහ නිෂ්පාදන ක්‍රමයේ දී පරිගණක ආධාරක නිෂ්පාදන ක්‍රමය (CMA) යෝග්‍ය වීමට හේතු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(i) අ).

1. නිමැවුම් පරිමාණය/ ඉල්ලුම
2. නිෂ්පාදිත පෙළ
3. නිෂ්පාදන ක්‍රියාවලියේ නම්‍යශීලී බව
4. නිපදවීම ඇණවුමටද? තොග සඳහාද? යන්න

***(කරුණු එකකට ලකුණු ½ බැගින් කරුණු 04කට ලකුණු 02)***

ආ).

1. දෝෂ අවම වීම
2. නාස්තිය, අපතය අවම වීම
3. නිෂ්පාදිත එකම ස්වරූපයෙන් පවත්වා ගෙන යා හැකි වීම

5. පිරිවැය අවම වීම
6. පර්යේෂණ හා සංවර්ධනය තුළින් ලබා ගන්නා තොරතුරු ඍජුවම නිෂ්පාදනයට සම්බන්ධ කළ හැකි වීම
7. ගුණාත්වය වැඩිකර ගත හැකි වීම
8. නිෂ්පාදනයට අවශ්‍ය දත්ත පදනමක් ගොඩ නගා ගත හැකි වීම

Visit EDUHUB

***(එක කරුණකට ලකුණු ½ බැගින් කරුණු 04කට ලකුණු 02)***

(ii) (අ) 'ශ්‍රම ඵලදායීතාව' යන්න නිර්වචනය කර, එය වර්ධනය කර ගැනීමට සංවිධානයකට යොදාගත හැකි ක්‍රමවේද **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) නිෂ්පාදකයකු විසින් භාණ්ඩ නිෂ්පාදනයේ දී සැලකිය යුතු ආචාරධර්ම **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ii) අ). නිශ්චිත කාල සීමාවක් තුළ ආයතනයක ශ්‍රම යෙදවුම් හා නිමවුම් අතර පවතින අනුපාතික සම්බන්ධතතාවය යි.

**හෝ**

$$\text{ශ්‍රම ඵලදායීතාව} = \frac{\text{නිමැවුම}}{\text{සේවක සංඛ්‍යාව/ ශ්‍රම පැය ගණන}}$$

*(ලකුණු 01)*

**<u>ක්‍රමවේද</u>**

1. පුහුණු සේවකයන් යොදා ගැනීම
2. සේවකයන් පුහුණු කිරීම
3. මූල්‍ය හා මූල්‍ය නොවන සේවක දිරිගැන්වීම් ලබා දීම
4. මනා සේවක සම්බන්ධතා පවත්වා ගැනීම

***(එක කරුණකට ලකුණු ½ බැගින් කරුණු 02කට ලකුණු 01)***

ආ).

1. ගුණාත්මක භාණ්ඩ සැපයීම
2. මුදලට සරිලන වටිනාකමක් ලබා දීම
3. ආරක්ෂිත නිෂ්පාදිත සැපයීම
4. පරිසරය පිළිබඳව සැලකිලිමත් වීම/ හරිත නිෂ්පාදන කෙරෙහි යොමු වීම

***(කරුණු 02ක් විස්තර කිරීමට ලකුණු 02)***

(iii) (අ) සඵලදායී සන්නිවේදනය මගින් ව්‍යාපාරයකට ලබාගත හැකි ප්‍රතිලාභ **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) විද්‍යුත් සන්නිවේදනයේ ඇති සීමා **හතරක්** ලියන්න. (ලකුණු 02 යි)

1. වෙළෙඳ ගණුදෙණු වලදී අදාළ පාර්ශව අතර අදහස් හුවමාරු කර ගත හැකි වීම
2. සේව්‍ය සේවක සම්බන්ධතා පවත්වා ගෙන යා හැකි වීම
3. මානව හා භෞතික සම්පත් මනාව කලමනාකරණය කිරීම සඳහා
4. අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා

***(එක කරුණකට ලකුණු ½ බැගින් කරුණු 04කට ලකුණු 02)***

Visit EDUHUB

ආ).

1. පුද්ගල සම්බන්ධතා අඩු වීම
2. විශ්වාසය නොමැති වීම
3. සන්නිවේදන උපකරණ භාවිතයේදී සිදුවන බාහිර බාධා
4. භාවිතා කරන්නන්ගේ ආකල්ප
5. පුද්ගලයන්ගේ දැනුම ප්‍රමාණවත් නොවීම
6. තාක්ෂණික යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම

***(එක කරුණකට ලකුණු ½ බැගින් කරුණු 04කට ලකුණු 02)***

(iv) (අ) මින්ස්බර්ග්ගේ කළමනාකරණ තීරණ භූමිකාව අනුව කළමනාකරුවකු ව්‍යවසායකයකු ලෙස සලකන්නේ ඇයි? (ලකුණු 01 යි)

(ආ) අභිප්‍රේරණය තුළින් සංවිධානයකට සහ සේවකයන්ට ලැබෙන ප්‍රතිලාභ **තුන** බැගින් දක්වන්න. (ලකුණු 03 යි)

(iv) අ). වෙනස්වන පරිසර තත්වයන්ට ගැලපෙන පරිදි ව්‍යවසායකයා විසින් සංවිධානය තුල වෙනස් කිරීම් සිදු කරන නිසාය.

***(ලකුණු 01)***

ආ).

| සංවිධානයකට | සේවකයාට |
|---|---|
| 1. සේවක ඵලදායීත්වය ඉහළ නංවා ගත හැකිය | 1. සේවක ඉපයීම වැඩිකර ගත හැකිය. |
| 2. නිෂ්පාදන ධාරිතාව ඉහළ නංවා ගත හැකිය. | 2. සේවක තෘප්තිය ඉහළ යාම |
| 3. තෘප්තිමත් සේවක පිරිසක් බිහි වීම | 3. කාර්යයන් පහසුවෙන් ඉටු කළ හැකි වීම |
| 4. සේවක ප්‍රවාසිතාවය අවම වීම | 4. ආයතනය කෙරෙහි පක්ෂපාතී බව වැඩි වීම |
| 5. සේවක පිරිවැටුම අවම වීම | 5. සේවකයන්ගේ කැපවීම ඉහළ යාම |

***(කරුණකට ලකුණු ½ බැගින් කරුණු 03කට ලකුණු 1 ½ )*** ***(කරුණකට ලකුණු ½ බැගින් කරුණු 03කට ලකුණු 1 ½ )***

(v) හරිත ව්‍යවසායකයින් ආර්ථිකයට වැදගත් වන ආකාරය උදාහරණ **දෙකක්** සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(v)

1. පරිසර හිතකාමී නිෂ්පාදන බිහි කිරීම තුළින් සම්පත් නාස්තිය අවම වීම

3. හරිත රැකියා බිහි කිරීම
4. හරිත නිෂ්පාදන ක්‍රම හඳුන්වා දීම

***(එක් කරුණකට ලකුණු 02 බැගින් කරුණු 02ට ලකුණු 04)***

Visit EDUHUB

**7.** සබන් නිෂ්පාදනායතනයක් තම නිෂ්පාදන විවිධ පාරිභෝගික කණ්ඩායම් අනුව වෙනස් වෙළඳ නාම යටතේ නිෂ්පාදනය කර අලෙවි කරනු ලැබේ. නව නිෂ්පාදනයක් හඳුන්වා දීමට ප්‍රථම මෙම ආයතනය වෙළඳපොළ පර්යේෂණ සිදු කරයි.

(i) (අ) විවිධ පාරිභෝගික කණ්ඩායම් සඳහා මෙම ආයතනය තම නිෂ්පාදන සිදු කරන්නේ ඇයි දැයි විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) මෙම ආයතනය යොදාගනු ලබන්නේ ගනුදෙනුකරු සංකල්පය ද නැතහොත් විකුණුම් සංකල්පය ද යන්න හේතු සහිතව දක්වන්න. (ලකුණු 02 යි)

(i) අ).

1. පාරිභෝගික කණ්ඩායම්වල විවිධ ආදායම් මට්ටම් පැවතීම
2. පාරිභෝගික රුචිකත්වයන් වෙනස් වීම
3. වෙළෙඳපොළ විවිධාංගීකරණය කිරීමට
4. ආයතනයට තම වෙළෙඳපොළ කෙරෙහි පවතින අවධානම අවම කර ගත හැකි වීම

*(අවම වශයෙන් ඉහත කරුණු 2ක් සහිත පිළිතුරකට ලකුණු 02)*

ආ). ගණුදෙණුකරු සංකල්පය

*(ලකුණු 01)*

හේතු - ඒ ඒ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සොයා බලා ඔවුන්ට ගැලපෙන සේ නිෂ්පාදිත බිහි කිරීම.

*(ලකුණු 01)*

(ii) (අ) මෙම භාණ්ඩය කුමන පාරිභෝගික භාණ්ඩ වර්ගයට අයත් වන්නේ ද? (ලකුණු 01 යි)

(ආ) නව නිෂ්පාදන හඳුන්වාදීමට ප්‍රථම වෙළෙඳපොළ පර්යේෂණ තුළින් ආයතනයකට ලබාගත හැකි වාසි **තුනක්** විස්තර කරන්න. (ලකුණු 03 යි)

(ii) අ). පහසු භාණ්ඩයකි *(ලකුණු 01)*

ආ). **වාසි**

1. පාරිභෝගික රුචිකත්වය හඳුනා ගත හැකි වීම
2. පාරිභෝගික ඉල්ලුම දැන ගත හැකි වීම
3. එම නිෂ්පාදිතය හා සමාන තරඟකාරි නිෂ්පාදිත පිළිබඳව තොරතුරු දැන ගත හැකි වීම

5. ඉලක්ක මිල පිළිබඳව අවබෝධයක් ලබා ගත හැක වීම
6. ප්‍රවර්ධන ක්‍රම පිළිබඳව සොයා බැලිය හැකි වීම
7. නව නිෂ්පාදිතයේ නිෂ්පාදන සැලසුම් පිළිබඳව තොරතුරු ලබා ගත හැකි වීම

*(එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු තුනකට ලකුණු 03)*

Visit EDUHUB

(iii) භාණ්ඩයක් එහි ජීවන චක්‍රයේ පරිණත අදියරට පැමිණි පසු එය දීර්ඝ කර ගැනීම සඳහා යොදා ගත හැකි උපායමාර්ග **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(iii)

1. නව අංගෝපාංග එකතු කිරීම
2. ප්‍රවර්ධන උපක්‍රම වෙනස් කිරීම
3. භාණ්ඩය භාවිත කරන වෙනත් ආකාර හඳුන්වා දීම
4. භාණ්ඩය නවීකරණය කිරීම
5. භාණ්ඩය විවිධාංගීකරණය කිරීම

*(කරුණකට ලකුණු 01 බැගින් කරුණු 04කට ලකුණු 04)*

(iv) (අ) මුදල් අයවැය ලේඛනයක් පිළියෙල කිරීමෙන් ව්‍යාපාරයකට ලැබෙන ප්‍රතිලාභ **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) ප්‍රාග්ධන ආයෝජන තීරණ සඳහා නිදසුන් **හතරක්** ලියන්න. (ලකුණු 02 යි)

(iv) අ).

1. අනාගතයේ දී මුදල් අතිරික්තයක් වේ නම්, එය කල් තබා දැන ගත හැකි වීමෙන් එම මුදල් ඵලදායීව ආයෝජනය කළ හැකි වීම
2. අනාගතයේ දී මුදල් ඌණතාවක් වේ නම්, එයද කල් තබා දැනගෙන ඊට මුහුණ දීමට සූදානම් විය හැකි වීම
3. සත්‍ය මුදල් ක්‍රියාකාරිත්වය හා සැසඳීම මගින් මුදල් පිළිබඳ සැලසුම්කරණය හා පාලනය පහසු වීම
4. ව්‍යාපාරික ණය ලබා ගැනීම සහ ව්‍යාපාරයේ අනාගත මූල්‍ය තත්වය තහවුරු කිරීම සඳහා ඉවහල් වීම

*(එක කරුණකට ලකුණු ½ බැගින් කරුණු 04කට ලකුණු 02)*

ආ).

1. ව්‍යාපාර නවීකරණය පිළිබඳ තීරණ
2. නැවත ස්ථාපනය කිරීම පිළිබඳ තීරණ
3. ව්‍යාපාර වැඩි දියුණු කිරීම පිළිබඳ තීරණ
4. ව්‍යාපාර විවිධාංගීකරණය කිරීම පිළිබඳ තීරණ

*(එක් නිදසුනකට ලකුණු ½ බැගින් හතරට ලකුණු 02)*

(v) (අ) 'ක්‍රියාකාරී අනුපාත' යනු කුමක් දැයි දක්වා, එහි ඇති වාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) 'අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ' යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(v) අ). වත්කම්වල ආයෝජනය හා ඒවායින් ජනිත කරන ඉපයීම් අතර ඇති සම්බන්ධතාවය පෙන්නුම් කරන අනුපාතයයි.

*(ලකුණු 01)*

Visit EDUHUB

**වාසි**

1. ආයෝජනයේ ප්‍රතිලාභ පිළිබඳව අවබෝධයක් ලබා ගත හැකි වීම
2. ණයගැති පිරිවැටුම් පිළිබඳ අවබෝධය ලබා ගත හැකි වීම
3. තොග පිරිවැටුම් පිළිබඳ අවබෝධය ලබා ගත හැකි වීම

***(කරුණු එකකට ලකුණු 1/2 බැගින් කරුණු 02කට ලකුණු 01)***

ආ). වාණිජ බැංකු අතර කෙටි කාලීන ණය ඉල්ලුම් සහ ණය සැපයුම් සිදුවන වෙළෙඳ පොලයි.

***(ඉරි ඇඳි කොටස සහිත පිළිතුරකට ලකුණු 02)***

8. (i) (අ) සේවකයින් බාහිරව බඳවා ගැනීමෙන් සංවිධානයකට ලැබෙන වාසි **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)
(ආ) 'රැකියාස්ථ පුහුණුව' මගින් ඇතිවිය හැකි අවාසි **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(i) අ).

1. නව දැනුම ඇති පුද්ගලයන් ආකර්ෂණය කර ගත හැකි වීම
2. නව ආකල්ප හා අදහස් ලබා ගැනීමට හැකි වීම
3. තනතුරු සඳහා යෝග්‍යතම පුද්ගලයන් බඳවා ගත හැකි වීම
4. පුහුණු ශ්‍රමිකයන් බඳවා ගැනීමෙන් පුහුණුව හා සංවර්ධනය සඳහා වැයවන පිරිවැය අඩු වීම
5. සේවක විවිධත්වය ඇති වීම

***(එක් කරුණකට ලකුණු 1/2 බැගින් කරුණු 04කට ලකුණු 02)***

ආ).

1. පැරණි සේවකයන්ගේ අයහපත් චර්යා නව සේවකයන් වෙත යොමු වීම
2. නව විද්‍යාත්මක ශිල්ප ක්‍රම නොලැබීම
3. ප්‍රධානියාගේ කාර්යයන් වැඩි වීම තුළින් කාර්යක්ෂමතාවය අඩු වීම
4. සේවකයාගේ ආතතියට හේතුවිය හැකිවීම
5. නිෂ්පාදනය අඩු වීම
6. විවිධ හැකියා සහිත සේවකයන් අඩු වීම

*කුණු 02)*

Visit EDUHUB

(ii) (අ) කාර්ය සාධන ඇගයීම සංවිධානයකට කෙසේ වැදගත් වන්නේ දැයි ආකාර **දෙකක්** මගින් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) වඩාත් ම සුදුසු රැකියා අපේක්ෂකයා තෝරා ගැනීම සඳහා සංවිධානයකට යොදාගත හැකි ක්‍රමවේද **දෙකක්** උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ii) අ).

1. පුහුණු කිරීමේ අවශ්‍යතා හඳුනා ගැනීමට
2. උසස් කිරීම් හා මාරු කිරීම් පිළිබඳ තීරණ ගැනීමට
3. සංවේතන පිළිබඳ තීරණය කිරීමට
4. හැකියා සහිත සේවකයන් හඳුනා ගැනීම
5. ඇගයීම් දත්ත මත අනාගත බඳවා ගැනීමේ ක්‍රියාවලිය වෙනස් කල හැකි වේ.

***(විස්තරාත්මක කරුණු 02කට ලකුණු 02)***

ආ).

- සම්මුඛ පරීක්ෂණ
- බුද්ධි පරීක්ෂණ
- පෞරුෂත්ව පරීක්ෂණ
- ප්‍රායෝගික පරීක්ෂණ
- වෛද්‍ය පරීක්ෂණ
- පසුබිම් පරීක්ෂණ

***(උදාහරණ සහිත ක්‍රමවේද එකකට ලකුණු 01 බැගින් ක්‍රම වේද දෙකකට ලකුණු 02)***

(iii) (අ) ඵලදායී තොරතුරු පද්ධතියක කාර්ය **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) අන්තර්ජාලය මගින් තොරතුරු හුවමාරුව සිදු කිරීමේ දී ව්‍යාපාරයකට ඇතිවන **වාසි දෙකක්** සහ අවාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(iii) අ).

1. අදාළ පාර්ශවයන්ට නිවැරදිව තොරතුරු සන්නිවේදනය කිරීම
2. නිෂ්පාදිත ගුණත්වය ඉහල නංවාලීමට සහාය වීම
3. ආයතනයේ පිරිවැය අවම කිරීම සඳහා සහාය වීම

5. කළමනාකරණ කාර්යයන්හි සාර්ථක භාවය තහවුරු කිරීම
6. අවශ්‍ය කවර හෝ අවස්ථාවකදී අවශ්‍ය පාර්ශවයන්ට අදාළ තොරතුරු ලබා දීම

***(එක් කරුණකට ලකුණු ½ බැගින් කරුණු 04කට ලකුණු 02)***

Visit EDUHUB

ආ). **වාසි**

1. පිරිවැය අඩු කර ගත හැකි වීම
2. නිෂ්පාදිත ගෝලීය ප්‍රවර්ධනය පහසු වීම
3. වෙළෙඳපොළ සොයා ගැනීම පහසු වීම
4. සන්නිවේදනය පහසු වීම
5. වේගවත් වීම හා කාලය අඩු වීම

***(වාසි 02කට ලකුණු 01)***

**අවාසි**

1. තාක්ෂණික දැනුම අවශ්‍ය වීම
2. යටිතල පහසුකම් අවශ්‍ය වීම
3. මූලිකව විශාල පිරිවැයක් දැරිය යුතු වීම
4. සේවකයන් පුහුණු කිරීමට අමතර පිරිවැයක් දැරීමට සිදු වීම
5. තාක්ෂණය ඉක්මනින් වෙනස් වීම

***(අවාසි 02කට ලකුණු 01)***

(iv) (අ) ව්‍යාපාර සැලැස්මක වැදගත්කම පිළිබිඹු වන හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 01 යි)
(ආ) ව්‍යාපාර සැලැස්මක් සැකසීමට අවශ්‍ය වන අවස්ථා **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

(iv) අ).

1. ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාම සඳහා මඟ පෙන්වීම
2. ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශවයන්ට ව්‍යාපාරය පිළිබඳව අවබෝධයක් ලබා දීමට
3. ව්‍යාපාරයට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා ගැනීමට
4. ව්‍යාපාරය කරගෙන යාමේදී ඇතිවිය හැකි ගැටළු විසඳා ගැනීමට
5. විභව ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීමට

***(හේතු 02කට ලකුණු 01)***

ආ).

1. නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී
2. ව්‍යාපාරයක් පුළුල් කිරීමේදී
3. ව්‍යාපාර ඒකාබද්ධ කිරීමේදී

5. ව්‍යාපාරයක් මිලදී ගැනීමේදී

***(අවස්ථා එකකට ලකුණු 01 බැගින් අවස්ථා 3කට ලකුණු 03)***

Visit EDUHUB

(v) නිෂ්පාදනයක මුළු පිරිවැය රුපියල් මිලියන 25 ක් වන අතර ඉන් රුපියල් මිලියන 15 ක් ස්ථාවර පිරිවැය වේ. ව්‍යාපාරයේ මුළු ආදායම රුපියල් මිලියන 20 කි. අලෙවි පුරෝකථන මගින් අනාගතයේ දී මෙම නිෂ්පාදනයට ඉහළ ඉල්ලුමක් ඇතිවිය හැකි බවට වාර්තා කර ඇත. ආයතනයේ නිෂ්පාදන කළමනාකරු විසින් නිෂ්පාදනය නතර කළ යුතු යැයි යෝජනා කළ නමුත් අලෙවි කළමනාකරු විසින් එය අඛණ්ඩව සිදු කළ යුතු බවට යෝජනා කරන ලදී. නිෂ්පාදනය අඛණ්ඩව සිදු කළ යුතු ද නැතහොත් නතර කළ යුතු ද යන්න පිළිබඳව ඔබගේ තීරණය දක්වා, එම පිළිතුරට හේතු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(v). අඛණ්ඩව කරගෙන යාම

***(ලකුණු 01)***

**හේතු**

1. ඉල්ලුම ඉදිරියේදී වැඩිවන නිසා
2. ඉදිරියේදී නිෂ්පාදන වැඩි වී ආදායම වැඩිවිය හැකි වීම
3. ආයතනය වසා දැමුවහොත් වෙනත් නිෂ්පාදන වලට යොමු වීමට බලපෑමක් ඇති වීම
4. දැනට යොදවා ඇති ආයෝජනය ආරක්ෂා කර ගැනීමට හැකියාව නොලැබීම
5. වෙනත් ආයෝජන අවස්ථා අහිමි වීම

***(කරුණු 03කට ලකුණු 03)***

Visit EDUHUB